# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2238/34 - 2021 ජූලි මස 30 වැනි සිකුරාදා - 2021.07.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී-බී. 19/78 (V)

**1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනත**

1978 අංක 2 දරන අධිකරණ සංවිධාන පනතේ 61 වන වගන්තිය සමග කියවිය යුතු ඒ පනතේ 60 වන වගන්තිය යටතේ, අග්‍ර විනිශ්චයකාරවරයාගේ එකඟත්වය ඇතිව, අධිකරණ අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝගය.

**එම්. යූ. එම්. අලි සබ්රි,**
අධිකරණ අමාත්‍ය.

2021 ජූලි මස 29 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

1979 ජූලි මස 2 වැනි දින අංක 43/4 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද, කලින් කල සංශෝධනය කරන ලද නියෝග එහි උපලේඛනයෙහි පිළිවෙළින් I වන තීරය සහ II වන තීරය අගට පහත දැක්වෙන විෂයය එකතු කිරීමෙන් ඒ උපලේඛනය මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ.

| *"I වන තීරය* <br> *අධිකරණ* | *II වන තීරය* <br> *නීති කෘත්‍ය හෝ කාරණා වර්ගය* |
| --- | --- |
| උතුරු පළාත තුළ පිහිටි යාපනය, කිලිනොච්චිය, මුලතිවු, වවුනියා සහ මන්නාරම දිසා අධිකරණ සහ මහේස්ත්‍රාත් අධිකරණ | යම් බද්දක් හෝ ගාස්තුවක් පනවමින් ඒ පළාතේ පළාත් සභාව විසින් සාදන ලද යම් මූල්‍ය ප්‍රඥප්තියකින් උද්ගත වන සියලු නඩු, නීති කෘත්‍ය හෝ කාරණා". |

08 - 295


1A - PG 5522 — 370 (2021/08) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.
*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*